රුහුණ විශ්වවිද්‍යාලය

**2018/2019 අධ්‍යයන වර්ෂය**

**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථර**

**පළමු සමාසික පරීක්ෂණය - 2019 ඔක්තෝබර්**

**GEO 21673 - ස්වාභාවික පරිසරය සහ සම්පත්**

<u>ප්‍රශ්න හතර (04)කට</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය: පැය 03 යි.**

---

1. (අ). පරිසර පද්ධතියක් යන්න නිර්වචනය කර එහි මූලික සංරචක සහ ක්‍රියාවලිය සැකවින් විස්තර කරන්න. (ලකුණු 07)

   (ආ). "ඇතැම් මානව ක්‍රියාකාරකම් පරිසර පද්ධතියක ගතික තුලිතතාව බිඳ දැමීමට හේතු වේ". ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රධාන පරිසර පද්ධතියක් ඇසුරින් මෙම ප්‍රකාශය පහදන්න. (ලකුණු 08)

2. "වනාන්තර සංරක්ෂණය සහ කළමනාකරණය ප්‍රජා සහභාගීත්වය රහිතව කළ හැක්කක් නොවේ". ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ සහ කළමනාකරණ අභියෝග පිළිබඳව අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 15)

3. "ජෛව විවිධත්ව හායනය ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධානතම අභියෝගයකි". ජෛව විවිධත්ව හායනයට හේතුවන සාධක සහ බලපෑම් ඇසුරින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 15)

4. (අ). ස්වභාවික සම්පතක් වශයෙන් ජල සම්පතේ සුවිශේෂීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (ආ). ශ්‍රී ලංකාවේ ජල සම්පත් සහ ජල මූලාශ්‍ර කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

   (ඇ). ජල සම්පත් දූෂණයට බලපාන හේතු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

5. පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳව භූගෝල විද්‍යාත්මක දෘෂ්ඨිවාදයන් ගෝලීය සංවර්ධන කථිකාවන්ට අනුරූපව කාලීනව වෙනස් වී ඇති ආකාරය නිදර්ශන සහිතව විමර්ශණය කරන්න. (ලකුණු 15)

6. (අ). 'හරිත විප්ලවය' යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ). 'හරිත විප්ලවය' ඇතිවීම සඳහා බලපෑ සමාජ-ආර්ථික පසුතලය විමර්ශන කරන්න. (ලකුණු 05)

(ඇ). සංවර්ධන ප්‍රවේශයක් ලෙස 'හරිත විප්ලවය' යොදා ගැනීමේ දී මුහුණ දෙ පාරිසරික අභියෝග විචාරත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 07)

7. (අ) පාරිසරක බලපෑම් තක්සේරුව යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ). නියමිත ව්‍යාපෘතියක් (Prescribed Project) යනු කුමක්දැයි නිදසුන් දක්වමි කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 03)

(ඇ). ශ්‍රී ලංකාවේ පාරිසරක බලපෑම් තක්සේරු ක්‍රියාවලිය (EIA process) හා එ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 09)

@@@@@@@@@@@